## සේරුවිල ප්‍රාදේශීය සභාව

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

### 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 22 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 පෙබරවාරි 23 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය.

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, සේරුවිල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු .

**(අ)** සමුච්චිත අරමුදලේ 2011 වර්ෂයේ ආරම්භක ශේෂය හා 2010 වර්ෂයේ අවසාන ශේෂය අතර රු. 2,978,530 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ආ)** ස්ථාවර වත්කම් වෙනුවෙන් ප්‍රතිපූර්ණ සංචිතයක් ගොඩනංවා නොතිබුණි.

**(ඇ)** ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත්ව තිබූ පහත දැක්වෙන වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව නොමැති බව නිරීක්ෂණය විය.

| | |
|---|---|
| අත් කරත්ත | 02 |
| ලීටර් 5000 වතුර ටැංකි | 01 |
| ජල මෝටර් | 02 |
| ෆැක්ස් යන්ත්‍ර | 01 |

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.</u>

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්.</u>

2011 දෙසැම්බර් 31 දින වන විට විගණණ විමසමකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර එකී විමසුමට භාජනය වූ ගණුදෙනුවල ගණනය කල හැකි වටිනාකම රු. 3,008,530 ක් විය.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 28,195,215 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය.</u>

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 2,780,841 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 349,436 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය.</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍යආදායම් සහ හිඟ ආදායම්.</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 31 | 888 | (857) |
| (ii) | බදු කුලී | 2,590 | 801 | 1,789 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 141 | 148 | (07) |
| (iv) | වෙනත් ආදායම් | 1,798 | 3,817 | (2,019) |

2.2.2 **හිඟ කඩකුලී**

2011 දෙසැම්බර් 31 දින රු. 298,023 ක හිඟ කඩබදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන.**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ගබඩා